## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2014

**---------------------------------------------------------------**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

### 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළමතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ගිණුම්කරණ ප්‍රමිත අංක 01 | | ආයතනයක් විසින් එහි වියදම්, වියදම්වල ස්වභාවය අනුව හෝ ආයතනයේ කාර්යයන්ට අදාළවන ආකාරයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වුවත් කොමිෂම විසින් කොමිෂමේ කාර්යයන්වලට පරිබාහිර කාර්යයන් සඳහා වැය කර තිබුණු රු. මිලියන 930.8ක් ආයතනයේ කටයුතු නියාමනය කිරීමේ වියදමක් (Regulatory Expenses) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙකී වියදම සමාලෝචිත වර්ෂයේ නියාමන වියදම්වලින් සියයට 92 ක් විය. ආරම්භයේ සිට ආයතනික, සමාජයීය වගකීම යටතේ කරන ලද වියදම් නියාමන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වන බවත් මෙය පරිපාලන වියදමක් නොවන හෙයින් පරිපාලන වියදම් යටතේ දැක්විය නොහැකි බවත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමක ලෙස යහපාලනික වියදමක් ලෙස ආයතනික, සමාජයීය වගකීම හඳුන්වා දිය හැකි බැවින් නියාමන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද බවත් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2015 ජූනි 19 දින මා වෙත දන්වා තිබුණි. |
| (ආ) ගිණුම්කරණ ප්‍රමිත අංක 08 | | ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස හඳුනාගත් රු. මිලියන 195 ක් අතීතානුයෝගීව සංසන්දනාත්මක තොරතුරුවලට ගැලපීමක් නොකර සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි. |
| (ඇ) ගිණුම්කරණ ප්‍රමිත අංක 16 | (i) | දේපළ පිරියත උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීමේදී වත්කම් භාවිතය සඳහා යෝග්‍ය තත්ත්වයට පත්කල දිනසිට ක්ෂය කළ යුතු වුවද, කොමිෂන් සභාව විසින් වත්කම් මිලදී ගැනීමේදී සම්පූර්ණ වර්ෂය වෙනුවෙන්ද, ඉවත්කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේද ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි. |
| | (ii) | කොමිෂන් සභාවට අයත් අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමෙන් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් -කටාන විසින් අත්පත් |

කරගෙන තිබුණු අතර සම්පූර්ණ ඉඩමේ වටිනාකම රු. මිලියන 45ක් වශයෙන් දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි. වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට පියවර ගත යුතු වුවත් පසුගිය වර්ෂ 12 ක කාලය තුළ මෙය ගිණුම් සටහනක් මගින් පමණක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනු ලබන පිරිවැය රු. මිලියන 445.7ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳ මූල්‍ය ප්රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඈ) ගිණුම්කරණ ප්‍රමිත අංක 18

(i) මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර අවුරුදු 10කට හා 05කට වරක් නිකුත් කරන බැවින් බලපත්‍ර ගාස්තු අළුත් කිරීමේදී අයකරන ගාස්තු අළුත් කිරීම සිදුකළ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවත් මේ සඳහා අදාළ කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ රු. මිලියන 2,060 ක් වූ මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 261ක් දක්වා විචලනය වී තිබුණි.

(ii) නව සංඛ්‍යාත විකිණීමෙන් ලද ආදායම, (Frequency upfront fees) ආදායම හඳුනා ගැනීමේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(iii) ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු ගාස්තු අයකිරීම්වලින් ක්‍රියාකරු ආයතන සමඟ හුවමාරු කරගත් මුදල (නැවත ගෙවන ලද) වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනවා වෙනුවට අයකරන ලද ශුද්ධ අගය එනම් රු. මිලියන 5,493 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඉ) ගිණුම්කරණ ප්‍රමිත අංක 23

නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා එ.ජ. ඩොලර් මිලියන 88.655 ක ණය මුදලක් 2012 වර්ෂයේදී ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එයින් එ.ජ. ඩොලර් මිලියන 34.98 ක් වැය කර තිබුණි. මෙම ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. මිලියන 1,413 ක ණය ගැනුම් පිරිවැයක් දරා තිබුණද මෙම ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධනිත කරන ලද සුදුසුකම් ලත් ණය ගැනුම් පිරිවැයෙහි ප්‍රමාණය සහ එය ප්‍රාග්ධනිත කිරීමේ අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී රු. 113,052,702 ක් වටිනා ඉන්වොයිස් පෙර වර්ෂය වෙනුවෙන් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සංඛ්‍යාත බලපත්‍ර ආදායම රු. මිලියන 113 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවෙහි ණයගැතියන් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුදලින් රු. මිලියන 355ක මුදලක් වර්ෂ 02 කට වැඩි ණය ශේෂයන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද, එම ශේෂය තුළ වර්ෂ 20 කට වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂයන්ද ඇතුලත්ව තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 116 ක් අයවිය යුතුව තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වනවිට සංඛ්‍යාත 08 කට ඉන්වොයිස් කර නොතිබුණි.

(ඇ) වර්ෂ 02ට වැඩි කාලයක සිට අයනොවී පවතින සේවක ණය ශේෂය රු. මිලියන 2 ක් විය.

(ඈ) කොකාවිල් ඇන්ටනා සහ ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරනු ලබන ක්‍රියාකරුවන්ගෙන් අයවිය යුතු විදුලි බිල් හා විදුලි ජනක යන්ත්‍ර සඳහා වන ඉන්ධන වියදම වූ රු. මිලියන 71.6ක මුදල 2011 ජූනි මාසයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ණයගැති ශේෂ ලැයිස්තුව අනුව රු. 999,418 ක සෘණ ශේෂයන් සහිත ණයගැතියන්ගේ සංඛ්‍යාව 248 ක් වූ අතර මෙම සෘණ ශේෂය ලියා හැරීමට කටයුතු නොකර දීර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම ගිණුම්වල පෙන්වා තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2000 ජූනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/09 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් රු. මිලියන 14,700 ක මුදලක් බැංකුවක ස්ථාවර තැන්පත්වල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ අතර කොමිෂන් සභාව විසින් 2003 වර්ෂයේ ඉතිරි කිරීමේ බැංකු ගිණුමක ඇමරිකන් ඩොලර් 420,000ක මුදලක්ද තැන්පත් කර තිබුණි. |
| (ආ) | 2011 ජනවාරි 27 දිනැති අංක පීඊ 56 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | ආයතනයේ මාස 06ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ඇති අරමුදල් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවද කොමිෂන් සභාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත<br>(i) 6(i)(අ) වගන්තිය | කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රු. 5,000,000 ඉක්මවන අවස්ථාවක සෑම ලංසුකරුවෙකුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි විය යුතු වුවත්, රු. මිලියන 2,494 ක් වූ හම්බන්තොට |

තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉදිරිපත් වූ ලංසුකරුවන් එසේ ලියාපදිංචි වී සිටි ටෙන්ඩර්කරුවන්ද යන්න සනාථ කරගෙන නොතිබුණි.

(ii) 12 වන වගන්තිය

මේ පනත යටතේ නිකුත් කරන ලද වලංගු ලියාපදිංචි සහතිකයක් ඇති බව ටෙන්ඩර් මණ්ඩලය / ඇගයීම් මණ්ඩලය විසින් තහවුරු කරගත යුතු වුවත් එසේ කර නොතිබුණි.

තවද ලංසුව පිරිනමා දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම මෙම පනත යටතේ ලියාපදිංචි කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය:

(i) II පරිච්ඡේදයේ 2.3 වගන්තිය

කොමිෂන් සභා අනුමැතිය මත කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් බඳවා ගැනීම් සඳහා බඳවා ගැනීම් පරිපාටියක් සකස් කර එය භාවිතා කළද ඒ සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. 1996 අංක 27 දරන විදුලි සංදේශ සංශෝධන පනතේ 22(ඇ)(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව බඳවා ගැනීම් පරිපාටිය කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව,2015 ජූනි 19 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ii) VII පරිච්ඡේදයේ 12.5.4 හා 12.6.1 වගන්ති

තනතුරක වැඩ බැලීමට පත්කිරීමේදී වැඩ බලන තනතුරට හිමි වැටුපෙන් සියයට 25 ක් පමණක් ගෙවිය හැකි වුවත් කොමිෂන් සභාවේ වැඩ බැලීම සඳහා පත්කළ නිලධාරිනියන් දෙදෙනෙකුට වැඩ බලන තනතුරේ වැටුපෙන් සියයට 50 ක් ගෙවා තිබුණි. මෙහිදී 2013 සැප්තැම්බර් සිට 2014 දෙසැම්බර් දක්වා සියයට 50ක දීමනාවක් ලෙස වැඩියෙන් ගෙවා තිබුණු මුදල රු. 460,000 ක් විය. ඉහත වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන සංග්‍රහය අනුව ගෙවීම් කළ බව කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2015 ජූනි 19 දින මා වෙත දන්වා තිබුණි.

(iii) XXIV පරිච්ඡේදයේ 7.2.5 වගන්තිය

වාහන ණය මුදලක් ලබාගත හැක්කේ වසර 05කට වරක් පමණක් වුවද, භාෂා පරිවර්තකවරියක් විසින් 2006 මැයි මස ලබාගත් වාහන ණය මුදලේ ශේෂය 2010 ජූනි මස පියවා එම වසරේදීම රු. මිලියනයක මුදලක් වාහන ණය ලෙස ලබාගෙන, නැවතත් 2014 පෙබරවාරි 05 දින ගෙවීමට තිබූ ණය ශේෂය පියවා 2014 මාර්තු 12 දින රු. මිලියන 2.7 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 2012 අගෝස්තු 14 දිනැති අංක TRC/04/2012 දරන චක්‍රලේඛය ප්‍රකාරව මෙසේ වාහන ණය

| | | |
|---|---|---|
| | | ලබාදී ඇති බව කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2015 ජූනි 19 දින මා වෙත දන්වා තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි757(2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | 2007 ජූනි 12 දිනැති අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | වාහන ණය ගෙවීම වාණිජ බැංකු මගින් සිදුකළ යුතු බව දන්වා ඇතත් කොමිෂන් සභාවේ 2013 අගෝස්තු 14 දිනැති අංක TRC/04/12 දරන චක්‍රලේඛය පාදක කරගෙන සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ අරමුදලින් නිලධාරීන් 35 දෙනෙකුට රු. මිලියන 64 ක වාහන ණය මුදල් ගෙවා තිබුණි. |
| (උ) | 2007 ජූනි 12 දිනැති අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.2 (ආ) ඡේදය සහ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7.4.1 උප වගන්තිය | වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසීම් නොකොට ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව සියයට 4.2 ක වාර්ෂික පොලියක් පමණක් කොමිෂන් සභාව විසින් අයකරගෙන තිබුණි. |
| (ඌ) | 2005 ජනවාරි 27 දිනැති අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අවසන් ගිණුම සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (එ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ | |
| | (i) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛයේ 6 වගන්තිය | 2014 ඔක්තෝබර් 19 සිට නොවැම්බර් 08 දක්වා කොරියාවේ පැවති වැඩසටහනට සහභාගී වූ නිලධාරීන්ගෙන් චක්‍රලේඛය ප්‍රකාර දෙවන ගණයට අයත් නිලධාරීන් 15 දෙනෙකුට පළමු ගණයට අයත් ලෙස සලකා සංයුක්ත දීමනාව දිනකට US$ 400 බැගින් ගෙවා තිබුණි. ගෙවිය යුතු සංයුක්ත දීමනාව දිනකට US$ 320 ක් බැවින් රු. මිලියන 1.9 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| | 6(V) වගන්තිය | විදේශ ගමන් සඳහා දීමනා ගෙවීමේදී දින 15 ඉක්මවන අවස්ථාවලදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එය ලබාගෙන නොතිබුණි. එසේ අනුමැතියකින් තොරව දින 6 බැගින් නිලධාරීන් තිදෙනෙකුට රු. 870,844 ක සංයුක්ත සහ අනියම් දීමනාවක් ගෙවා තිබුණි. |
| | (ii) 2011 දෙසැම්බර් 30 දිනැති අංක බීඩී/සීපීබී/1/1/2012 චක්‍රලේඛයේ 04 ඡේදය | සේවකයකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ප්‍රමාණය රු. 250,000 ක උපරිමයකට සීමා කළ යුතු වුවත් TRC/2012 දරන චක්‍රලේඛය අනුව අවස්ථා 39 කදී එම සීමාව ඉක්මවා රු. මිලියන 9ක් ගෙවා තිබුණි. |
| (ඒ) | මැතිවරණ කොමසාරිස්ගේ 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/2015/43 දරන ලිපිය | 2015 ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා කැඳවීමේ දිනය වූ 2014 නොවැම්බර් 21 දින සිට ජනාධිපතිවරණය පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් |

ජනාධිපතිවරණ කාලසීමාව තුළදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවල බලතල යටතේ විධිමත් ලෙස කරනු ලබන බඳවා ගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරුවීම් හැර රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් සිදුකිරීමෙන් වැලකී සිටිය යුතු බවට දන්වා තිබුණද ඊට පටහැනිව කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි නිලධාරීන් 12 දෙනෙකුට 2015 ජනවාරි 01 දින ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.

| | | |
|---|---|---|
| (ඔ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ පදනම් කරගෙන පැමිණීමේ දීමනා, ප්‍රසාද දීමනා, සන්නිවේදන දීමනා හා නිවාස කුලී දීමනා ලෙස රු. මිලියන 36 ක් ගෙවා තිබුණි.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2007 ජූනි 01 දිනැති හා අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩලය සඳහා රු.2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද, එම අනුමත සීමාව ඉක්මවා මාසිකව රු. 6,000 ක් බැගින් ප්‍රවාහන දීමනාවක් ලබාදී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාර බලය ඉක්මවා ගෙවා තිබුණු මුදල රු. මිලියන 17ක් විය.

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධනවලට අනුව උපයනවිට ගෙවීම් මත බදු අදාළ නිලධාරීන්ගෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද, නිලධාරීන්ගෙන් අඩුකර ගැනීමකින් තොරව එකතුව රු. 6,782,889 ක උපයන විට ගෙවීම මත බදු කොමිෂන් සභාවේ අරමුදලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි.

(ඈ) 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 ට පටහැනිව හා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ කටයුතු කිරීම වෙනුවෙන් කොමිෂන් සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් මාසිකව රු.455,000 ක් බැගින් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මෙසේ ගෙවා තිබුණු මුදලරු. මිලියන 10.9ක් විය.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ බදු පෙර ලාභය රු. මිලියන 46,266ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු. මිලියන 47,367 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 1,101 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු හා නව සංඛ්‍යාත වෙන්දේසි කිරීමෙන් ලද ගාස්තු රු. මිලියන 7,459 කින් අඩුවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 කොමිෂමට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

බාහිර ආයතන, බාහිර පුද්ගලයින් හා ආයතනයේ සේවකයින් විසින් කොමිෂමට එරෙහිව අධිකරණවල නඩු 13ක් ගොනුකර තිබුණ අතර එයින් බාහිර ආයතන 02ක් විසින් පිළිවෙලින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත කොමිෂන් සභාවෙන් එකතුව රු.මිලියන 47,346 ක් වන්දි ලෙස ඉල්ලා තිබුණි.

**04. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 විදුලි සංදේශ ජාලය ක්‍රියාත්මක කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විදුලි සංදේශ ජාලය නිසියාකාරව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් අරමුණක් වුවත් සංඛ්‍යාත භාවිතයේදී විවිධ බාධා වීම් සිදුවන බව නිරීක්ෂණය විය. මේ බව තහවුරු කරමින් ක්‍රියාකරුවන් විසින් හා අනෙකුත් පුද්ගලයින් විසින් සංඛ්‍යාත භාවිතා කිරීමේදී ඇති වූ බාධා වීම් සම්බන්ධව පැමිණිලි 27ක් සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමුකර තිබුණි. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවතින සංඥා නිරීක්ෂණය කිරීමේ පද්ධතිය අවුරුදු 17කට වඩා පැරණි බැවින් නව ගුවන්විදුලි තරංග නිරීක්ෂණය කිරීමේදී අපහසුතා ඇතිවී තිබූ බව 2015 ජූනි 19 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) සංඛ්‍යාත ලබාදී තිබුණු ආයතන 166 ක් සම්බන්ධව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදි, ආයතන 58 ක එනම් සියයට 35ක් සඳහා ලිපිගොනු ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එයින්ද ආයතන 45 ක ලිපිගොනු අවුරුදු 10 සිට ක්‍රියාත්මක නොවන බව තවදුරටත් නිරීක්ෂණය විය. මෙසේ ක්‍රියාත්මක නොවන ආයතනවල උපකරණ සීල් තබා වසා දැමීම සාමාන්‍ය ක්‍රියාපටිපාටිය වුවත් මෙතෙක් එම ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙමගින් මෙම ආයතනවලට බලපත්‍ර ගාස්තු නොගෙවා ක්‍රියාත්මක කිරීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 25 දින වන විටත් විදුලි සංදේශ ක්‍රියාකරු ආයතන 07 කින් විගණිත අවසාන ගිණුම් ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී එම ආයතනවලින් ලද රු. මිලියන 978 ක සෙස් බදු මුදලේ නිවැරදිතාවය තහවුරු කරගැනීමට නොහැකි විය.

(ආ) සෙස් බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය බලය ලබාගැනීමේ වගන්ති විදුලි සංදේශ පනතට ඇතුළත් කිරීමට කටයුතු කරන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2011 ජූනි 28 දින හා 2012 ජූනි 16 දිනයන්හි මා වෙත දන්වා ඇතත් මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා නොතිබීම හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පමණක් නිකුත් කරන ලද ඉන්වොයිස් අතුරින් රු. මිලියන 68 ක ඉන්වොයිස් සඳහා 2015 මාර්තු 03 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි. එසේම සංඛ්‍යාත බලපත්‍රය ලබාගැනීම ප්‍රමාදවීම මත ප්‍රමාද කාලය තුලදී බලපත්‍රයක් රහිතව සංඛ්‍යාත භාවිතා කිරීමට අවස්ථාව ලබාදී තිබුණි.

(ඈ) ආයතන 20 කට ලබාදී ඇති සංඛ්‍යාත වෙනුවෙන් අවුරුදු 02 සිට අවුරුදු 14 දක්වා කාල පරිච්ඡේදයකින් ඉන්වොයිස් නිකුත් කර නොතිබුණ අතර එසේ නොකිරීමට හේතු වූ කරුණු විගණනයට අනාවරණය නොකෙරුණි.

(ඉ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත අනුව විදුලි සංදේශ බදු ඊළඟ මාසයේ 15 දිනට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වුවද බදු ගෙවිය යුතු ආයතන 03 ක් විසින් 2011, 2012 හා සමාලෝචිත වර්ෂවලට අදාලව බදු ගෙවීම කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජනාධිපති ලේකම්වරයා කොමිෂමේ සභාපතිවරයාද වන අතර ඔහු විසින් ජනාධිපති ලේකම්වරයා වශයෙන් කරන ලද ඉල්ලීමකට අනුව, 2014 දෙසැම්බර් 15 දිනැති කොමිෂන් සභා තීරණය මත සමාජ සාරධර්ම සහ ආගමික සම්ප්‍රදායන් සුරැකීම සඳහා ජනතාව දිරිගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා එනම්, වැඩිහිටියන් සහ පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිල් රෙදි බෙදාදීම වෙනුවෙන් රු. මිලියන 600 ක මුදලක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ජනාධිපති ලේකම් කාර්යාලයට ගෙවා තිබුණි.

(ආ) දිවයිනේ සියළු විහාරස්ථාන වෙත ලබාදීම සඳහා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරයෙකුගේ ඉල්ලීමක් පදනම් කරගෙන සහ කොමිෂන් සභා තීරණයක් මත 2015 වර්ෂය සඳහා දිනපොත් 30,000 ක් මුද්‍රණය කර බෙදා හැරීමට රු. මිලියන 18ක් වැය කර තිබුණි.

(ඇ) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව කුඩා දහම් පොත් 500,000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු. මිලියන 2.5 ක් කොමිෂන් සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ වූ සමාගමක් වෙත ගෙවා තිබුණි.

(ඈ) අමාත්‍ය මණ්ඩලයේ හා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ඉදිකෙරෙමින් පවතින දක්ෂිණ විශ්ව විද්‍යාලය සඳහා රු. මිලියන 250 ක් ලබාදී තිබුණි.

(ඉ) ගොඩනැගිල්ලක් කුලියට ගැනීම හා ඒ සඳහා කාර්යාල උපකරණ ලබාගැනීම:

(i) කොමිෂන් සභා තීරණයට අනුව ලොන්ඩන් පෙදෙසේ පිහිටි ගොඩනැගිල්ලක් මාස 06 ක අත රැඳවුම් මුදල් ලෙස රු. මිලියන 1.8 ක මුදලක් ගෙවා මාසිකව රු. 300,000 ක් බැගින් ගෙවීමේ පදනම මත මිල ගණන් කැඳවීමකින් තොරව හා මු.රෙ. 835(2)(ඇ) වගන්තිය හා 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට එක් අවුරුදු කාල සීමාවක් සඳහා ලබාගෙන තිබුණි.

(ii) කොමිෂන් සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත බැවින් එම කටයුත්ත සිදුකරන තුරු කොමිෂන් සභාවේ ඇතැම් කාර්යාල එම ස්ථානයට රැගෙන යෑමේ අවශ්‍යතාවය මත මෙම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගත් බව දන්වා තිබුණ නමුත් කොමිෂන් සභා ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර හෝ කොමිෂන් සභා කාර්යාල, කුලී ගොඩනැගිල්ල වෙත ගෙන ගොස් හෝ නොතිබුණි.

(iii) මෙම ගොඩනැගිල්ල විමර්ශන ඒකකයක් යනුවෙන් හඳුන්වා පරිගණක මිලදී ගැනීම් ඇතුළු වියදම් සඳහා රු. මිලියන 10ක් වැය කර තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව හම්බන්තොට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළව උපදේශක සේවාව ලබාගැනීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 132 ක ගිවිසුම්ගත වටිනාකමට ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට (SLLRDC) භාරදී තිබියදී බාහිර උපදේශකවරු තිදෙනෙකුට මාසයකට රු. 100,000 බැගින් මාස 04 ක කාල සීමාවකට රු. මිලියන 1.2 ක අමතර මුදලක් ගෙවා තිබුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නෙළුම් කුළුණ ඉදිකිරීම

(i) 2012 සැප්තැම්බර් 17 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ චීන ආනයන අපනයන බැංකුව එළඹ ඇති ණය ගිවිසුමට අනුව චීන ආනයන අපනයන බැංකුව විසින් කොමිෂන් සභාව වෙත එ.ජ.ඩොලර් මිලියන 88.655 ක් ලබාදීමට එකඟවී තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු 2015 මැයි 12 වනවිට එනම් දින 912 කින් නිම කිරීමට එකඟවී තිබුණද ඉදිකිරීම් කටයුතු 2015 ජූලි 13 දින දක්වාම අවසන්වී නොමැති බැවින් ණය මුදලින් උපයෝජනය කර නොමැති එ.ජ.ඩොලර් මිලියන 53ක ප්‍රමාණය සඳහා සියයට 0.7ක එකඟතා ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණු අතර ණය මුදල ගෙවා නිමකළ යුතු කාලය දීර්ඝ වීමෙන් ඒ සඳහා ගෙවිය යුතු පොළියද වැඩිවී තිබුණි.

(ii) නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් සේ සලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුළුණ ඉදිකිරීමට තෝරාගත් ඉඩම, දැනට වැයකර ඇති පිරිවැය පමණක් අයකර ගැනීමේ පදනම මත කොමිෂන් සභාව වෙත පවරා දිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එසේ වුවද, නාගරික සංවර්ධන අධිකාරිය දරන ලද වියදම පමණක් ගෙවීමට කටයුතු නොකර රු. බිලියන 11.7 ක් ගෙවීමට කටයුතු කර එයින් රු. බිලියන 2.1 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවා තිබුණි.

(iii) ණය මුදල රක්ෂණය සඳහා රු. මිලියන 1,145 ක් රක්ෂණ සමාගමක් වෙත ගෙවා තිබුණි. මෙම ණය රක්ෂණ මුදල ගෙවීමේදී රක්ෂණ ආයතනය සමඟ එකඟ වූ ගිවිසුමක් ඉදිරිපත් නොවුණු අතර ඉදිකිරීමේ ප්‍රමාදය ණය රක්ෂණය කෙරෙහි බලපාන ආකාරය තහවුරු කරගැනීමට නොහැකි විය.

(iv) ඉදිකිරීම් වැඩ කරගෙන යන අතරතුරදී ව්‍යාපෘතියේ සංකීර්ණභාවය අනුව වරින් වර සැලසුම්වල සංශෝධනය සිදු කිරීමට අවශ්‍යවන බව විගණනය වෙත දැනුම් දී තිබුණද විගණන දිනය වන විටත් එනම් වැඩ නිමකළ යුතු කාලයෙන් ආසන්න වශයෙන් සියයට 95 ක කාලයක් ගතවී තිබියදීත් කොන්ත්‍රාත් පිරිවැය වෙනස්වීම් පිළිබඳ වාර්තාවක් සකස් කර නොතිබුණි.

(v) මූලික වැඩ සැලසුම්වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට කුළුණෙහි වැඩ අවසාන අදියරේ තිබිය යුතු අතර 2015 මැයි 12 වන විට ඉදිකිරීම අවසන් කර සියළු උපකරණ සවිකිරීමද අවසන් කර තිබිය යුතුය. නමුත් 2015 මාර්තු 16 දිනට මුළු ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 46.87ක් පමණක් විය.

(ආ) හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම:

(i) මෙම ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය දළ වශයෙන් රු.මිලියන 2,000 ක් බව අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව (වැට් බදු රහිත) අනුව ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 2,663 දක්වා වැඩිකර තිබුණි.

(ii) රු. මිලියන 434 කට ඇස්තමේන්තු කර තිබුණු උස් කළ ගෙබිම (Raised Floor) කාර්යය ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු මිල රු. මිලියන 130 ක් පමණක් විය. එසේ වුවත් පසුව මෙම කාර්යය වෙනත් උප කොන්ත්‍රාත්තුවක් ලෙස පැමිණීමේ දීමනාව රු. මිලියන 15 ක් ඇතුළුව රු. මිලියන 449 කට පවරා දී තිබුණි. මේ අනුව කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවීමට එකඟ වී තිබුණ මුදල රු. මිලියන 319 ක් විය.

(ඇ) කොමිෂන් සභාවේ බිම් මහලෙහි ශ්‍රවනාගාරය නවීකරණය කිරීම:

(i) මෙම නවීකරණ කටයුත්ත සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 වගන්තියට අනුව විවෘත මිල කැඳවීමකින් තොරව එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලබාගෙන තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු මිල ගණන් මත රු. 1,774,353ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11(අ) හා 5.4.10 වගන්ති අනුව ලංසු සුරක්ෂණ ලබාගැනීම සහ කාර්යසාධන බැඳුම්කර ලබාගැනීම සිදුකර නොතිබුණු අතර 8.9.1(අ) වගන්තිය පරිදි ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්යය මණ්ඩලය 291 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 207 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 84 ක් විය. කොමිෂමේ කාර්යයන් ඉටුකිරීම සඳහා මූලිකව දායක වන අංශ දෙකක එනම් Spectrum Management Network & Technology අංශය හා Economic & Legal Affairs අංශවල පමණක් පැවති පුරප්පාඩු සංඛ්‍යාව 42 ක් විය.

(ආ) අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිර තනතුරු සඳහා 11 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර මෙම අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මුදාහල නිලධාරියෙකු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ තනතුරකට පමණක් බඳවා ගත යුතු වුවත් ඊට පටහැනිව සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුරෙහි පිහිටුවා එම තනතුරට හිමි වැටුපක් හා අනෙකුත් වරප්‍රසාද ලබාදී තිබුණ අතර 2015 ජූලි 31 දින දක්වා සේවා දිගුවක්ද ලබාදී තිබුණි.

## 05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2014 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ (ඇ) පරිදි කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනයේ අයවැය ගත අගයන් හා තථ්‍ය අගයන් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විය. ඇතැම් විචලනයන් සියයට 10 සිට සියයට 19,980 දක්වා පරාසයක් තුළ විහිදී තිබුණි. අයවැය ලේඛනයට ඇතුලත් නොකළ විෂයයන් 08 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 14,478 ක් වැය කර තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ හා 2013 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ 2015 ජූනි 19 දින වන විටත් සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපති වෙත වාර්තා කළ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) අයවැය
(ආ) සංයුක්ත සැලැස්ම
(ඇ) ණයගැතියෝ
(ඈ) ආයෝජන
(ඉ) ප්‍රසම්පාදන
(ඊ) දීමනා ගෙවීම්
(උ) කොන්ත්‍රාත් පාලනය
(ඌ) ආදායම් එකතු කිරීම